# බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය

## ආපනශාලා සේවය

## 2026/2027

## ලංසු ලේඛන

**සේවා සැපයුම්කරුගේ නම :** ................................................................

**ලිපිනය :** ................................................................

................................................................

................................................................

UNIVERSITY COLLEGE OF KULIYAPITIYA

**බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය**
**ලංසු සඳහා ආරාධනා**
**ආපනශාලා සේවයේ විධිවිධාන 2026/2027**

1. බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ආපනශාලා සේවා සැපයීම සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවයි.

2. ලංසු ඉදිරිපත් කිරීම සඳහා සුදුසුකම් ලැබීමට ලංසුකරු අසාදු ලේඛනගත කර නොතිබිය යුතුය.

3. ලංසු කරුවන්ට රජයේ හෝ පුද්ගලික ආයතනවලට ආපනශාලා සේවා සැපයීමේ අවම වසරක පලපුරුද්දක් පැවතිය යුතුය.

4. වැඩිදුර තොරතුරු සතියේ දිනවල දු.ක. අංක 036 2235570 මගින් බටංගල විශ්වවිද්‍යාල විද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී හරහා ලබාගත හැකිය.

5. මුද්‍රා තැබූ ලංසු 2026.05.04 වන දින ප.ව. 02.00 ට හෝ ඊට පෙර ලියාපදිංචි තැපැල හරහා පහත ලිපිනයට එවීම හෝ සහකාර රෙජිස්ට්‍රාර් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදුකල හැකිය. ප්‍රමාද වූ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කිරීම 2026.05.04 එනම් එදිනම පස්වරු 02.15 ට සිදු කෙරේ.

6. බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනයේ සේවකයකු සමඟ සමීප පවුල් සබඳතාවක් පවත්වන සේවකයකු හෝ සමාගමක් සහ/හෝ පුද්ගලයකු කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට සුදුසුකම් නොලබයි.

සභාපති
ප්‍රසම්පාදන කමිටුව
බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය
පනාවල
ඇහැළියගොඩ

**විශ්වවිද්‍යාල විද්‍යායතනය - බටංගල**
**2026/2027 වර්ෂය තුල බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ආපනශාලා සේවය**
**පවත්වාගෙන යාම සඳහා ලංසු අයදුම්පත්‍රය**

1 **ඉල්ලුම්කරුගේ නම**

..................................................................................................................................

2 **ස්ථිර ලිපිනය** (පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම සේවා නිළධාරී සහතිකය අමුණන්න)

..................................................................................................................................

..................................................................................................................................

3 **තාවකාලික ලිපිනය**

..................................................................................................................................

..................................................................................................................................

4 **අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය** (හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් අමුණන්න)

...............................................................

5 **දුරකථන**

**ස්ථාවර** **ජංගම**

..................................................... .....................................................

6 **අයදුම්කර ඇති සේවාව පිළිබඳ පළපුරුද්ද**

**1.** විශ්වවිද්‍යාල විද්‍යායතනය තුල

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

**2.** වෙනත් ආයතන වල

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

7 **අයදුම්කරු සතු මූල්‍ය හා වෙනත් වත්කම් :**

**1.** බැංකු ගිණුම් විස්තර (යාවත්කාලීන කරන ලද බැංකු ගිණුම් පිටපත් අමුණන්න)

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

**2.** ප්‍රවාහන පහසුකම්

| වාහනය | අංකය |
|---|---|
| .................................................... | .................................................... |
| .................................................... | .................................................... |
| .................................................... | .................................................... |

**3.** උපකරණ

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

**4.** සේවකයින්

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

**5.** අයදුම්කර ඇති සේවාව කාර්යක්ෂම අයුරින් පවත්වාගෙන යාමට ඉවහල් වන වෙනත් විශේෂ හැකියාවන්

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

**8** මෙයට පෙර මෙම විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ආපනශාලාව පවත්වාගෙන ගියේ නම් හෝ ආපනශාලාවේ සේවය කර ඇත්නම් ඒ පිළිබඳ විස්තර

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

**9** සේවාව අතරමඟ දී නවතා ගොස් ඇත්නම් ඊට හේතු

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

**10** අයදුම්කරු පිළිබඳ ව විමසා බැලිය හැකි වගකිව යුතු ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් ලිපින හා දුරකථන අංක

| **1.** | **2.** |
|---|---|
| ................................................................ | ................................................................ |
| ................................................................ | ................................................................ |
| ................................................................ | ................................................................ |
| ................................................................ | ................................................................ |
| ජාතික හැඳුනුම්පත් අංකය | ජාතික හැඳුනුම්පත් අංකය |
| ................................................................ | ................................................................ |

මෙම අයදුම්පතේ සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. තවද අදාල සේවාව සඳහා මා තෝරා ගැනීමට පෙර හෝ තෝරා ගැනීමෙන් පසුවද මා විසින් ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට ඔප්පු වුවහොත් ඕනෑම වේලාවක මාගේ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල විද්‍යායතනය විසින් ගන්නා තීරණයන්ට එකඟ වෙමි. තවද, මෙම ලංසුව පිළිගැනීමේ හෝ නොපිළිගැනීමේ හෝ අවලංගු කිරීමේ සම්පූර්ණ අයිතිය බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය සතු බවද දනිමි.

| | |
|---|---|
| ................................................................ | ................................................................ |
| දිනය | අයදුම්කරුගේ අත්සන |

**ඇමුණුම් ලියකියවිලි** (අමුණා ඇති ලියකියවිලි වලට අදාළ (✓) ලකුණු යොදන්න.)

| | | |
|---|---|---|
| **i.** | සම්පූර්ණ කරන ලද මිල දර්ශනය | |
| **ii.** | දූටු බවට කෙටි අත්සන් යෙදූ ටෙන්ඩර් නියමයන් හා කොන්දේසි | |
| **iii.** | දූටු බවට කෙටි අත්සන් යෙදූ සේවායෝජකගේ අවශ්‍යතා | |
| **iv.** | දූටු බවට කෙටි අත්සන් යෙදූ සේවායෝජකගේ අවශ්‍යතා | |
| **v.** | දූටු බවට කෙටි අත්සන් යෙදූ ප්‍රතිග්‍රහන ලිපිය | |
| **vi.** | දූටු බවට කෙටි අත්සන් යෙදූ ගිවිසුම් පත්‍රය | |

<u>**ටෙන්ඩර් නියමයන් හා කොන්දේසි.**</u>

<u>**බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ආපන ශාලා සේවය පවත්වාගෙන යාම - 2026/2027 වසර**</u>

**01.** මෙම විශ්වවිද්‍යාල විද්‍යායතනයට අයත් ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ටෙන්ඩර් කැඳවනු ලබන අතර ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කරනු ලබන සාර්ථක ටෙන්ඩර්කරුට ආපනශාලා සේවය පවත්වාගෙන යාම සඳහා පවරනු ලැබේ.

**02.** සාර්ථක ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් පත්‍රිකා සමග ඉදිරිපත් කර ඇති ආහරපාන මිල දර්ශනයේ දක්වා ඇති ආහාර පාන වර්ග වලින් අවම වශයෙන් 60% වත් දිනපතා සැපයිය යුතුය.

**03.** එයට අමතරව ආයතනයේ උත්සව අවස්ථා වැනි විශේෂ අවස්ථා වලදී ආයතනය විසින් ඉල්ලා සිටියහොත් විශේෂ ආහාර වට්ටෝරු වලට අනුකූලව ආහාර සහ කෙටි ආහාර සාර්ථකව ටෙන්ඩර්කරු විසින් සැපයිය යුතුය.

**04.** මෙම විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 40 ක පමණ කාර්යයමණ්ඩලයක් සේවයේ යෙදී සිටින අතර පාඨමාලා සඳහා පැමිණෙන සිසුන් 300 කින් පමණ සමන්විත වේ. මෙම සංඛ්‍යාව වරින් වර වෙනස් වේ.

**05.** මෙම විශ්වවිද්‍යාල විද්‍යායතනයේ හෝ රජයේ කොන්ත්‍රාත්තු පැහැර හැරි අසාධුගත ටෙන්ඩර්කරුවන් සමග කොන්ත්‍රාත් ඇති කරගනු නොලැබේ. ඉල්ලුම් කරන ටෙන්ඩර්කරු එසේ අසාධුගත නොවූවෙකු බවට රජයේ පිළිගත් නිලධාරියෙකු ඉදිරියේ සහතික කරන ලද දිවුරුම් ප්‍රකාශයක් ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කරන අවස්ථාවේදී ඉදිරිපත් කල යුතුය.

**06.** ලංසු අයදුම්පත්‍රය ඇතුළුව අදාළ ටෙන්ඩර් ලියවිලි ලබාගැනීමේදී ආපසු නොගෙවන ගාස්තු වශයෙන් රු. 250/= ක මුදලක් විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය අංශය වෙත ගෙවා රිසිට්පතක් ලබාගතයුතු අතර, එම රිසිට්පත, සම්පූර්ණ කරන ලද ටෙන්ඩරය ඉදිරිපත් කිරීමේදී ටෙන්ඩර් ලියවිලි සමග අමුණා ඉදිරිපත් කල යුතුය.

**07.** සෑම අයදුම්කරුවෙකුම, ලංසු සුරක්ෂණය ලෙස, ආපසු ගෙවනු ලබන රුපියල් 5,000/= ක මුදලක්, විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය අංශය වෙත ගෙවීමෙන් ලැබෙන රිසිට්පත හෝ, බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය නමින් ඇති අංක 029100140037975 දරණ මහජන බැංකුවේ (අවිස්සාවේල්ල ශාඛාවේ) ගිණුමේ තැන්පත් කර ඒ සඳහා ලැබෙන බැංකු රිසිට්පත අදාළ ටෙන්ඩර් ලියවිලි සමග අමුණා තිබිය යුතුය. සිය ටෙන්ඩරය පිළිගත් පසුව නියම කරන දිනට පෙර අදාළ ගිවිසුම් අත්සන් කිරීමට අපොහොසත් වුවහොත් එම පිළිගත් ටෙන්ඩර්කරුගේ නමින් ඇති මෙම තැන්පත් මුදල ආපසු ගෙවනු නොලැබේ. පිළිනොගන්නා ලද ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල්, තෝරාගන්නා ලද සාර්ථක, පිළිගත් ටෙන්ඩෙර්කරු, විසින් ඔහුට අදාළ කාර්යසාධන ඇප තැන්පතු මුදල තැන්පත් කිරීමෙන් පසු නොපමාව ආපසු ගෙවනු ලැබේ.

**08.** ටෙන්ඩරයේ අන්තර්ගත, මිල ගණන් ඇතුලත් ටෙන්ඩර් පත්‍රිකා සහ මේ සමග ඇති **ලංසු අයදුම්පත්‍ර පිටපත් දෙක බැගින්** සම්පූර්ණ කර ටෙන්ඩර්කරුගේ අත්සන හා දිනය යොදා, ඉතිරි ටෙන්ඩර් ලියකියවිලි වල දුටුබවට කෙටි අත්සන් තබා, එම සියළු ටෙන්ඩර් ලියකියවිලි කවරයක බහා මුද්‍රා තබා, වම්පස උඩ කෙලවරේ **"ආපනශාලා සේවය 2026/2027 - UCB/GA/AR/4/3/1/1/2026"** ලෙස සඳහන් කර සභාපති, ප්‍රසම්පාදන කමිටුව, බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය, පනාවල, ඇහැළියගොඩ වෙත **2026.05.04** දින **ප.ව. 02.00** හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් මෙම විශ්වවිද්‍යාල විද්‍යායතනයේ සහකාර ලේඛකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ටෙන්ඩර්කරුගේ පළපුරුද්ද, මුදල් තත්ත්වය සහ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා අවශ්‍ය සහතිකවල ඡායා පිටපත් ද තම අයදුම්පත් සමග එවිය යුතුය.

09. ලබා දී ඇති උපදෙස් වලට අනුකූලව ටෙන්ඩර්කරු සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත් පමණක් සැලකිල්ලට භාජනය කරන අතර පහත සඳහන් හේතු මත නුසුදුසු ටෙන්ඩර් ප්‍රතික්ෂේප කෙරේ.

1. නියමිත ආකෘති පත්‍රයේ ටෙන්ඩර් ඉදිරිපත් නොකිරීම.
2. 2026.05.04 දින ප.ව. 02.00 පසුව ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීම.
3. පැහැදිලි, අවශ්‍ය තොරතුරු හා ලියකියවිලි ඇතුලත් නොකිරීම.
4. සාවද්‍ය තොරතුරු ඇතුලත් කිරීම.
5. ටෙන්ඩර්පත්වල සියලුම සංශෝධනවලට ටෙන්ඩර්කරු විසින් ස්වකීය අත්සන නොයෙදීම.

10. **2026.05.04** දින **ප.ව. 02.15** ට විශ්වවිද්‍යාල විද්‍යායතනයේ සහකාර ලේඛකාධිකාරී කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. එම ටෙන්ඩර් විවෘත කරනු ලබන අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නිලධාරියෙකුට පැමිණ සහභාගී විය හැකිය. මෙම ආපනශාලා සේවය පවත්වාගෙන යාම එක් කොන්ත්‍රාත්කරුවෙකුට පමණක් පවරනු ලැබේ. කිසිම හේතුවක් නොදන්වා ඕනෑම ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතියද ප්‍රසම්පාදන කමිටුව සතුය. මෙම ටෙන්ඩරය පිළිබඳව විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වන්නේය.

11. තෝරාගන්නා ලද සාර්ථක, පිළිගත් ටෙන්ඩර්කරුට සම්පූර්ණ ආපනශාලා සේවා කොන්ත්‍රාත්තුව හෝ කොන්ත්‍රාත්තුවෙන් කොටසක් හෝ වෙනත් අයෙකුට පැවරිය නොහැකිය.

12. තෝරාගන්නා ලද සාර්ථක, පිළිගත් ටෙන්ඩර්කරු,, ගිවිසුම අනුව කටයුතු කිරීම සහතික වීම සඳහා, ටෙන්ඩරය ප්‍රදානය කල බැව් දැන්වූ ප්‍රතිග්‍රහන ලිපියේ දින සිට වැඩ කරන දින හතක් ඇතුලත ආපනශාලා සේවය සැපයීම සඳහා වන රු. **5,000/=** ක කාර්යසාධන ඇප තැන්පතු මුදලක් විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය අංශය වෙත ගෙවා ඒ සඳහා ලැබෙන රිසිට්පත ඉදිරිපත්කර හෝ, බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය නමින් ඇති අංක 029100140037975 දරණ මහජන බැංකුවේ (අවිස්සාවේල්ල ශාඛාවේ) ගිණුමේ තැන්පත් කර ඒ සඳහා ලැබෙන බැංකු රිසිට්පත ඉදිරිපත්කර, විශ්වවිද්‍යාල විද්‍යායතනය සමග ගිවිසුමකට එළඹිය යුතුය. එමෙන්ම ටෙන්ඩරය පිරිනමා දින 07 ක් ඇතුලත මෙහෙයුම් කටයුතු ආරම්භ කල යුතුය.

13. මෙම කොන්දේසි පත්‍රිකාවේ ඉහත 12 වන ඡේදය ප්‍රකාර තැන්පත් කරනු ලබන ආරක්ෂිත තැන්පතු මුදල, මෙම ටෙන්ඩරය හා අදාළ මොනයම් හෝ කොන්දේසියක් කඩ කිරීමේදී සිදුවිය හැකි අලාභ හෝ වන්දි ආදිය අඩු කිරීමට යටත්ව කොන්ත්‍රාත්තුව පවත්නා තෙක් මෙම විශ්වවිද්‍යාල විද්‍යායතනයේ රඳවාගනු ලැබේ. (තැන්පතු මුදල ආපසු ලබා ගැනීමේදී විශ්වවිද්‍යාල විද්‍යායතනයෙන් නිකුත් කල රිසිට්පතේ හෝ, බැංකු රිසිට්පතේ මුල් පිටපත ඉදිරිපත් කල යුතුය.)

14. ආපනශාලාවේ අදාළ උපකරණවල අලුත්වැඩියාවන් ආරක්ෂිත තැන්පතුවෙන් 10%ක පිරිවැය වටිනාකමක් දක්වා ගිවිසුම්ගතවූ සාර්ථක, පිළිගත් ටෙන්ඩෙර්කරු (මින් ඉදිරියට 'පිළිගත් ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරු') විසින්ම සිදුකරගත යුතු අතර ඊට වැඩි වටිනාකමක් සඳහා වූ අලුත්වැඩියාවන් පිලිබඳව විශ්වවිද්‍යාල විද්‍යායතනය විසින් සලකා බලනු ලැබේ.

15. පිළිගත් ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරු විසින් මෙම සේවාව හරියාකාරව පවත්වාගෙන යාමට අවශ්‍ය වයස අවු. 18 ට නොඅඩු නිරෝගී සේවකයින් සේවයේ යෙදවිය යුතුය. ඔවුන්ට පිළිගත් නීත්‍යානුකූල වේතන ගෙවිය යුතුය. එසේම අදාළ කම්කරු නියමාවලියට අනුකූලව කරනු ලබන ව්‍යවස්ථාපිත අඩුකිරීම්/ ගෙවීම් පිලිබඳ විස්තර (උදා. සේ.අ.අ. /සේ.නි. භා.අ. ) ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ප්‍රසම්පාදන අංශය වෙත ඉදිරිපත් කල යුතුය. යොදවනු ලබන සෑම සේවකයකුගේම අපේක්ෂිත විනය, පවිත්‍රතාවය සම්බන්ධයෙන් පිළිගත් ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරු වග කිව යුතුය. සේවක/ සේවිකාවන්ගේ සේවය පිලිබඳ පැමිණිලි ලැබුනහොත් ඒ ගැන කරුණු පරික්ෂා කර බලා අදාළ සේවක/ සේවිකාවන්ගේ සේවයේ යෙදවීම පිලිබඳ නියෝග ආපනශාලා කමිටුවේ නිර්දේශය මත අධ්‍යක්ෂකතුමා විසින් නිකුත් කෙරෙනු ඇත. පිළිගත් ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරු විසින් එම නියෝග ක්‍රියාත්මක කල යුතුය. මෙසේ නියෝග ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ආපනශාලා සේවකයෙකුට ගෙවීමට සිදුවන වේතන හෝ වන්දි

ආදිය වේ නම් ඒ සඳහා කිසිදු වගකීමක් විශ්වවිද්‍යාල විද්‍යායතනය සතු නොවන අතර ඒ සැම වියදමක්ම පිළිගත් ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරු විසින් දැරිය යුතුය.

මෙම සේවා හොඳ තත්ත්වයෙන් හරියාකාරව පවත්වාගෙන යන්නේද යන්න පරීක්ෂා කිරීමට, විශ්වවිද්‍යාල විද්‍යායතනය විසින් නම් කරන ලද ශිෂ්‍ය උපදේශකවරුන්ට, ආහාර කමිටු නියෝජිතයන්ට හෝ අධ්‍යක්ෂක විසින් බලය පවරනු ලැබූ ඕනෑම නිලධාරියෙකුට හෝ රජයේ අදාළ නිලධාරීන්ට බලය ඇත.

**16.** මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කල දින සිට අවුරුද්දක කාල සීමාවකට වලංගුය. එහෙත් මෙම කොන්ත්‍රාත් කාලය තෙමසක පරීක්ෂණ කාලයකට යටත් වන අතර එම පරීක්ෂණ කාලය තුල හරියාකාරව ආපනශාලා සේවය පවත්වාගෙන යාමට පිළිගත් ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරු අපොහොසත් වුවහොත් පරීක්ෂණ කාලය අවසානයේදී කොන්ත්‍රාත්තුව අවසන් කල හැක. කොන්ත්‍රාත් කාලය වසරකට වඩා දීර්ඝ කරන්නේ නම්, ප්‍රසම්පාදන කමිටුවේ අභිමතය පරිදි, සේවා පවත්වාගෙන යාමේ තත්ත්වය අනුව, කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීම පිළිබඳව සලකා බැලිය හැකිය.

කොන්ත්‍රාත්තුව දීර්ඝ කරන්නේ නම්, කොන්ත්‍රාත්තුව අවසන් වීමට දින 14කට පෙර පිළිගත් ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරුට දැනුම්දෙනු ඇත.

**17.** පිළිගත් ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරු විසින් ගිවිසගත් මිල ගණන් වලට ආහාරපාන සැපයිය යුතු අතර ස්වකීය අභිමතය පරිදි මිල ගණන් වෙනස් කල නොහැකි අතර අධ්‍යක්‍ෂකතුමාගේ හෝ ආහාර කමිටුවේ අනුමැතිය ඇතිව පමණක් වෙනස් කල හැක.

**18.** සපයන ලද ආහාරපානවල මුදල් අයකරගැනීමේ සම්පූර්ණ අයිතිය පිළිගත් ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරු සතු වේ.

**19.** ආපනශාලාව තුළ හෝ ඒ අවට විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ගෞරවය හෝ කීර්තිනාමය කෙළෙසෙන අන්දමේ විනය විරෝධී ක්‍රියාවක් නිරීක්ෂණය වුවහොත් ඒ සම්බන්ධයෙන් වහාම විශ්වවිද්‍යාල විද්‍යායතනයේ පාලන අධිකාරිය දැනුවත් කිරීමට පිළිගත් ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරු විසින් වගබලාගතයුතු අතර ඊට අනුබලදීම කිසිසේත්ම නොකළයුතුවේ.

**20.** පිළිගත් ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරුට සේවා පවත්වාගෙන යාමේ අපහසුතාවයක් ඇතොත් තෙමසක් කල් ඇතිව අධ්‍යක්ෂක වෙත ලිඛිතව දැනුම් දීමකින් පසුව කොන්ත්‍රාත්තුව අවසන් කල හැකිය. කොන්ත්‍රාත් කාලය තුල නිසියාකාරව සේවා පවත්වාගෙන යාමට අපොහොසත් වීම නිසා කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට සිදුවුවහොත් ආරක්ෂක තැන්පතුවෙන් 50% ක මුදලක් අයකරගැනීමට කටයුතු කරනු ඇත.

**21.** ගිවිසුම තුළින් මතුවන්නාවූ, අන්‍යෝන්‍ය අවබෝධයෙන් හා සාකච්ඡාවෙන් විසඳාගත නොහැකි සියලු ආරවුල්, 1995 අංක 11 දරන බේරුම් කිරීමේ පනතේ විධිවිධානවලට අනුකූලව සිදු කළ යුතු ය. බේරුම් කිරීමේ ස්ථානය ශ්‍රී ලංකාව වනු ඇත.

**22.** මෙම විශ්වවිද්‍යාල විද්‍යායතනයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට හෝ ශිෂ්‍යයන්ට මෙම සේවාව සඳහා අයදුම් කිරීමට අවසර දෙනු නොලැබේ.

**<u>සේවායෝජකගේ අවශ්‍යතා</u>**

**<u>බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ආපන ශාලා සේවය පවත්වාගෙන යාම - 2026/2027 වසර</u>**

පිළිගත් ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරු (සේවා සපයන්නා) විසින්,

**1.** විශ්වවිද්‍යාල විද්‍යායතන ශිෂ්‍යයින්, දෙමවුපියන් හෝ ශිෂ්‍යයන්ගේ භාරකරුවන්, කාර්ය මණ්ඩලය සහ කාර්ය මණ්ඩලයේඅමුත්තන් සඳහා සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදයන්ට අනුකූලව ආහාර සැපයිය යුතුය.

**2.** සියලුම ආපනශාලා සේවකයන් හඳුනා ගැනීමට පහසු වන ලෙස දිග කලිසමකින් හෝ සරමකින් හෝ එකම වර්ණයක කමිසයකින් සැරසී සිටිය යුතු අතර, නිරතුරුවම ආපනශාලා සේවකයන්ගේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය ආවරණ පිළි සහ විශ්වවිද්‍යාල විද්‍යායතනයේ කාර්යමණ්ඩලයේ සහ ශිෂ්‍යන්ගේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය සබන්, තුවා, අත්පිස්නා ආදිය සැපයිය යුතුය.

**3.** ආපනශාලාවේ පාවිච්චියට ගැනෙන පිඟන් සහ කෝප්ප, මැටි හෝ වීදුරු බඳුන් (ආහාර සඳහා ප්‍රමිතිගත) විය යුතු අතර අනෙකුත් භාජන, මැටි, ප්ලාස්ටික් හෝ වීදුරු උපකරණ විය යුතුය. ඒවා ඉතාමත් පිරිසිදු තත්ත්වයෙන් තිබිය යුතුය.

**4.** ආපනශාලාව සෑම දිනකම පෙ.ව. 8.00 සිට ප.ව. 4.00 දක්වා පමණක් සේවාව සඳහා විවෘත කර තැබිය යුතුය. ප.ව. 4.00 න් පසු විවෘත කර තැබිය යුතු විශේෂ අවස්ථාවලදී, විශ්වවිද්‍යාල විද්‍යායතනයේ අවසර ලබාගැනීම අනිවාර්ය වේ.

**5.** ආහාරපාන රස්කර තැබීම පිලිබඳව සනීපාරක්ෂක නීතිරීති වලට සරිලන පරිදි හා කෘමීන් හට පැමිණිය නොහැකි පරිදි ආවරණක් සහිතව ආහාරපාන තැන්පත් කල යුතු අතර පලුදුවීගිය හා නුසුදුසු භාණ්ඩ හෝ උපකරණ පාවිච්චි නොකළ යුතුය. (ආහාර පිළියෙළ කිරීම හා තබා ගැනීම පිලිබඳව විශ්වවිද්‍යාල විද්‍යායතනය මගින් සපයන වෙනත් උපදෙස් ඇතොත් ඒ අනුව කටයුතු කිරීමටද එකග විය යුතුය.)

**6.** පැමිණිලි සඳහා ලේඛණයක් පවත්වා ගත යුතුය. මෙම පැමිණිලි ආපනශාලා කමිටුව වෙත ඉදිරිපත් කල යුතු අතර ඒ පිලිබඳව එම කමිටුවේ තීරණ ලැබී තෙදිනක් ඇතුලත ඒවා නිවැරදි කල යුතුය.

**7.** සියලුම ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම හා සැපයීම ඉතා පිරිසිදුව කල යුතුය.

**8.** අත්ආවරණ පැළද හෝ ඒ සඳහා භාවිතා කරන උපකරණ භාවිතයෙන් පිසූ ආහාර හා කෑමට ගන්නා වෙනත් ආහාර සංග්‍රහ කිරීම කල යුතුය.

**9.** ආපනශාලාව තුල පිසින ලද ආහාර විශ්වවිද්‍යාල විද්‍යායතනයෙන් පිටතට රැගෙන යාම හෝ පිටත විකිණීම නොකළ යුතු අතර විශේෂ අවස්ථා වලදී ඒ සඳහා අවසර ලබා ගත යුතුය.

**10.** ආපනශාලාව, මුලුතැන්ගෙය සහ අවට මැසි මදුරුවන් බෝවීමකින් තොරව පවත්වාගෙන යා යුතුය. විශ්වවිද්‍යාල විද්‍යායතනයේ සනීපාරක්ෂක සේවා පවත්වා ගැනීමට අවහිර වන ආකාරයේ කිසිදු කටයුත්තක් සිදු නොකිරීමට වග බලා ගත යුතුය.

**11.** සෑම විටම ආපනශාලාව තුල යාවත්කාලීන කල මිල දර්ශනය ප්‍රදර්ශනය කර තැබිය යුතුය.

**12.** ආපනශාලා කොන්ත්‍රාත්තුව භාර ගනු පිළිගත් ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරු විසින් ආපනශාලාව හොඳින් පවත්වාගෙන යාම තහවුරු කිරීම සඳහා සතියේ සෑම දිනකම විශ්වවිද්‍යාල විද්‍යායතනය මගින් පවත්වාගෙන

යනු ලබන ලේඛනයේ සටහන් කිරීම අනිවාර්යය. පාලන අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ටෙන්ඩර් කාලය තුල ආපනශාලාව වසා තැබිය නොහැක.

**1.** අමතර ආහාර (උදා. බේකරි නිෂ්පාදන) සහ කෙටි ආහාර සහ පාන වර්ග රජයේ පිළිගත් මිල ගණන් හෝ ලකුණු කල මිල ගණන් යන දෙකෙන් අඩු මිල ගණනට සැපයිය යුතුය.

**2.** කෑම පාර්සල් වශයෙන් ලබා දෙන්නේ නම් ඒ සඳහා රු.10.00 ක අමතර මුදලක් අය කළ හැකිය.

**3.** ඉහත කොන්දේසි කඩකරන්නා වූ පිළිගත් ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරුට විරුද්ධව පහත සඳහන් පරිදි ක්‍රියා කල හැකිය.

    i. අධ්‍යක්ෂක හට මේ පිළිබඳව වාර්තා කර ඔහු හෝ ඇගේ නියමය පරිදි ක්‍රියා කිරීම.
    ii. අදාළ ගිවිසුමේ කොන්දේසි අනුව කටයුතු කිරීම.

**විශ්වවිද්‍යාල විද්‍යායතනය මගින් පහත කොන්දේසිවලට යටත්ව, පහත සඳහන් දෑ සපයනු ලැබේ.**

1. ආපනශාලවේ කෑම සැපයීම සඳහා අවශ්‍ය පිගන්, පීරිසි කෝප්ප සහ වීදුරු විශ්වවිද්‍යාල විද්‍යායතනය මගින් සපයනු ලබන අතර විශේෂ අවස්ථාවන් සඳහා ඉතිරි ප්‍රමාණය පිළිගත් ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරු විසින් සපයා ගත යුතුය. කොන්ත්‍රාත් කාලය අවසන් වී ආපනශාලාව ආපසු බාර දෙන විට විශ්වවිද්‍යාල විද්‍යායතනය මගින් සපයන ලද පිඟන්, පීරිසි කෝප්ප හා වීදුරුවල වල ඌනතාවයක් වුවහොත් එම අලාභය ආරක්ෂක තැන්පතු මුදලින් අඩු කිරීමේ හැකියාව විශ්වවිද්‍යාල විද්‍යායතනය සතුය.

2. ආහාර පිසීම සඳහා අවශ්‍ය මුළුතැන්ගෙයි උපකරණ හා භාජන වලින් සීමිත ප්‍රමාණයක් විශ්වවිද්‍යාල විද්‍යායතනය මගින් සපයනු ලැබේ. වරින් වර පිළිස්සෙන බොයිලේ

3. රූ එලිමන්ට්, පිළිගත් ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරු විසින්ම සපයා ගත යුතුය.

4. ආපනශාලාව සඳහා සාධාරණ ජල පරිමාවක් හා විදුලිය විශ්වවිද්‍යාල විද්‍යායතනය විසින්ම නොමිලේ සපයනු ලැබේ. එහෙත් ගෑස් සහ අනෙකුත් ඉන්ධන, පිළිගත් ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරු විසින් සපයා ගත යුතුය.

# <u>මිල දර්ශනය</u>

| බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය | | | |
|---|---|---|---|
| 2026/2027 වර්ෂය සඳහා ආහාරපාන මිල දර්ශනය | | | |
| අනු අංකය | ආහාර වර්ගය | විස්තරය/ප්‍රමාණය | විකුණුම් මිල (රු.) |
| උදෑසන ආහාරය | | | |
| 1. | බත් | සම්බෝල (තෙල් දමා), පරිප්පු හෝ අල කරි,බිත්තර ½ සමඟ (ග්‍රෑම් 400) | |
| | | සම්බෝල (තෙල් දමා), පරිප්පු හෝ අල කරි,හාල්මැස්සන්,කරවල ඒඹුණු දමා (ග්‍රෑම් 400) | |
| 2. | ඉදි ආප්පයක් | සම්බල් සමඟ | |
| 3. | සුදු ආප්පයක් | ලුණු මිරිස් සමඟ | |
| 4. | බිත්තර ආප්පයක් | | |
| 5. | තොසේ එකක් | සම්බල් සමඟ | |
| 6. | පොල් රොටියක් | ලුණු මිරිස් සමඟ | |
| 7. | එළවළු රොටියක් | | |
| 8. | ගෝදම්බ රොටියක්/ පරාටා 1ක් | | |
| 9. | බිත්තර රොටියක් | | |
| 10. | නූඩ්ල්ස් පිඟානක් | ග්‍රෑම් 400 (කැරට් හා ලීක්ස් සමඟ), සම්බෝල (තෙල් දමා),පරිප්පු සමඟ | |
| 11. | මඤ්ඤොක්කා /බතල වැනි අල වර්ගයක් | ලුණු මිරිස් සමඟ ග්‍රෑම් 170 | |
| 12. | කඩල හෝ කව්පි හෝ මුංඇට දීසියක් | ලුණු මිරිස් සමඟ ග්‍රෑම් 150 | |
| 13. | කිරිබත් කැටයක් | ලුණු මිරිස් සමඟ ග්‍රෑම් 125 | |
| 14. | පිට්ටු කෑල්ලක් | කිරි හොදි සමඟ | |
| 15. | පාන් කාලක් | පරිප්පු හෝ අල කරි සහ පොල් සම්බල් සමඟ ග්‍රෑම්112 | |
| 16. | පාන් බාගයක් | පරිප්පු හෝ අල කරි සහ පොල් සම්බල් සමඟ ග්‍රෑම්224 | |

| අනු අංකය | ආහාර වර්ගය | විස්තරය/ප්‍රමාණය | විකුණුම් මිල (රු.) |
|---|---|---|---|
| දිවා ආහාරය | | | |
| 17. | ෆ්‍රයිඩ් රයිස් (මිශ්‍ර එළවළු) බත් පිඟානක් | (ග්‍රෑම් 450) සලාදය,සීනි සම්බෝල | |
| 18. | කුකුල් මස් /බිත්තර /මාළු මිශ්‍ර ෆ්‍රයිඩ් රයිස් බත් පිඟානක් | (ග්‍රෑම් 450) එළවළු සලාදය,සීනි සම්බෝල | |
| 19. | එළවළු කෑම 01 | ග්‍රෑම් 450 (එළවළු 03ක් සමඟ) | |
| 20. | මාළු/මස් සමඟ කෑම 01 | එළවළු 03ක් සමඟ මාළු/මස් (ග්‍රෑම් 450) | |
| 21. | බිත්තර කෑම 01 | එළවළු 03ක් සමඟ බිත්තරයක් (ග්‍රෑම් 450) | |
| 22. | නූඩ්ල්ස් (එළවළු) | ග්‍රෑම් 450 | |
| 23. | නූඩ්ල්ස් (බිත්තර/ඉස්සෝ/කුකුල් මස්) | ග්‍රෑම් 450 | |
| 24. | අමතර බත් දීසියක් | ග්‍රෑම් 140 | |

| | | | |
|---|---|---|---|
| 25. | තම්බන ලද බිත්තරයක් | වෙළඳපල මිල අනුව වෙනස් විය හැක. | |
| 26. | බුල්ස්-අයි බිත්තරයක් | | |
| 27. | බාගෙට තම්බන ලද බිත්තරයක් | | |
| 28. | බිත්තර ඔම්ලට් 01 | සම්පූර්ණ බිත්තරයක් (එළවළු සමඟ) | |
| 29. | කුකුල් මස් දීසියක් | ග්‍රෑම් 70 | |
| 30. | බැදපු මාළු | ග්‍රෑම් 50 | |
| 31. | මාළු ව්‍යංජන දීසියක් | ග්‍රෑම් 50 | |
| 32. | සෝයා ව්‍යංජන දීසියක් | ග්‍රෑම් 50 | |
| 33. | සැමන් ව්‍යංජන දීසියක් | ග්‍රෑම් 50 | |
| 34. | පරිප්පු දීසියක් | ග්‍රෑම් 50 | |
| 35. | අර්තාපල් අල දීසියක් | ග්‍රෑම් 50 | |
| 36. | තක්කාලි හොදි දීසියක් | ග්‍රෑම් 50 | |
| 37. | බැදපු අල දීසියක් | ග්‍රෑම් 50 | |
| 38. | එළවළු කරි දීසියක් | ග්‍රෑම් 50 | |
| 39. | සීනි සම්බල් දීසියක් | ග්‍රෑම් 50 | |
| 40. | පොල් සම්බල් දීසියක් | ග්‍රෑම් 50 | |
| 41. | ගොටුකොළ/ ඇණු,කැරට් සම්බල් දීසියක් | ග්‍රෑම් 50 | |
| 42. | සැමන් සම්බල් දීසියක් | ග්‍රෑම් 50 | |
| 43. | පිපිඤ්ඤා සම්බල් දීසියක් | ග්‍රෑම් 50 | |

| අනු අංකය | ආහාර වර්ගය | විස්තරය/ප්‍රමාණය | විකුණුම් මිල (රු.) |
|---|---|---|---|
| **කෙටි කෑම වර්ගය** | | | |
| 44. | රෝල්ස් එකක් (මාළු) | ග්‍රෑම් 70 | |
| 45. | රෝල්ස් එකක් (එළවළු) | ග්‍රෑම් 70 | |
| 46. | පැටිස් එකක් (මාළු) | ග්‍රෑම් 42 | |
| 47. | පැටිස් එකක් (එළවළු) | ග්‍රෑම් 42 | |
| 48. | සමෝසා (එළවළු ) | | |
| 49. | සමෝසා (බිත්තර) | | |
| 50. | උළුඳු වඩේ එකක් | ග්‍රෑම් 42 | |
| 51. | පරිප්පු වඩේ එකක් | ග්‍රෑම් 42 | |
| 52. | කට්ලට් එකක් (මාළු/මස්) | ග්‍රෑම් 42 | |
| 53. | කට්ලට් එකක් (එළවළු) | ග්‍රෑම් 42 | |
| 54. | පැන් කේක් එකක් | | |
| 55. | කේක් කෑල්ලක් | ග්‍රෑම් 35 | |
| 56. | ක්‍රීම් බනිස් එකක් | | |
| 57. | ලැවරිය එකක් | | |
| 58. | හැලප එකක් | | |

| පාන වර්ග | | | |
|---|---|---|---|
| 59. | සීනි සහිත කිරි තේ කෝප්පයක් | මිලි ලීටර් 200 ට අඩු නොවිය යුතුය. | |
| 60. | සීනි සහිත කහට තේ කෝප්පයක් | | |
| 61. | හකුරු සමඟ කිරි තේ කෝප්පයක් | | |
| 62. | හකුරු සමඟ කහට තේ කෝප්පයක් | | |
| 63. | සීනි දැමූ කෝපි කෝප්පයක් | | |
| 64. | සීනි / කිරි දැමූ කෝපි කෝප්පයක් | | |
| 65. | පලතුරු කෝඩියල් එකක් | | |
| 66. | දොඩම් වීදුරුවක් | | |
| 67. | දිවුල් කිරි වීදුරුවක් | | |
| 68. | මිශ්‍ර පලතුරු යුෂ වීදුරුවක් | | |
| 69. | ෆලූඩා වීදුරුවක් | | |
| 70. | කොළ කැඳ වීදුරුවක් | | |

| අතුරුපස | | | |
|---|---|---|---|
| 87. | මී කිරි,පැණි සමඟ | | |
| 88. | ෆෘට් සැලඩ් එකක් | | |
| 89. | අයිස් ක්‍රීම් කප් එකක් | | |
| 90. | අයිස් ක්‍රීම් සමඟ ෆෘට් සැලඩ් කප් එකක් | | |
| 91. | වටලප්පම් | | |
| 92. | යෝගට් | | |